# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,495 - 2026 ජුනි මස 26 සිකුරාදා - 2026.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — | බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| | | විවිධ දැන්වීම් | |

*සැ. යු.* - (i) අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2026 ජුනි මස 19 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 ජුනි මස 19 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 17 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 03 වැනි දින (දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 - B 082805— - (2026/06)
F 1 -

# පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභා නිවේදන

### 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇති 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත - බලය පැවරීම

**බලය පැවරීම**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇති 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, නැගෙනහිර පළාත් ආණ්ඩුකාර වන ජයන්ත ලාල් රත්නසේකර වන මම, නැගෙනහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහාය වීමට පත්කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I වැනි තීරුවේ නම් සඳහන් එක් එක් අය වෙත 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇති 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ හා එම පනත යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III තීරුවෙහි සඳහන් සියලුම බලතල එකී උපලේඛනයේ II තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක කරනු පිණිස මෙයින් පවරමි.

ජයන්ත ලාල් රත්නසේකර,
ආණ්ඩුකාර,
නැගෙනහිර පළාත.

2026 ජුනි මස 11 දින,
ත්‍රිකුණාමලයේ දී ය.

**උපලේඛනය**

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* |
|---|---|---|
| 1. කළුතර ආචාරිගේ නලින් මහීකුමාර් | 2026.06.01 | සමුපකාර සමිති පනතේ 3, 4 [4 (2) හැර)], 5, 6, 7, 8, 33, 39, 42, 43, 44 [44 (6) හැර], 45, 46, 50, 52, 53, 54, 58, [58 (2) (අ) සහ 58 (5) හැර] 59, 68 සහ 72 වැනි වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියලුම බලතල සහ සමුපකාර රීති මාලාවේ 4, 11, 15, 16 (ii), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 [49 (xii) හැර], 52 සහ 53 දරන රීතිය යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියලුම බලතල. |
| 2. මොහොමඩ් කාසිම් ජලාල්ඩීන් | 2026.06.01 | |
| 3. මුහම්මත් ඉස්මයිල් හුමම්මත් ෆරීඩ් | 2026.06.01 | |
| 4. උමර් ලෙබ්බෙ මුහම්මඩ් ජෙසීම් | 2026.06.01 | |

06 - 379